කළමනාකරණ
සේවා නිලධාරි තරග විභාගය
අභියෝග්‍යතාවය සහ භාෂා හැකියාව

අවසන් මහා සම්මන්ත්‍රණය

ඔක්තෝම්බර් 03 සිකුරාදා

ඔක්තෝම්බර් 04 සෙනසුරාදා

THARANGA GAMAGE
SMART LEARNING CENTER
070 550 53 87

සම්මන්ත්‍රණයේ

මාර්ගෝපදේශය

THE ULTIMATE CONFERENCE GUIDE

ගණිතමය සංකල්ප මත ගොඩනැගුණු ගැටළු.

වඩාත් වැඩි ප්‍රශ්න ගණනක් කිරීමට නම්, අනිවාර්යෙන් ප්‍රශ්න-පත්‍රයේ දැකිය හැකි ගැටළුවලට හොඳින් සූදානම් වී යායුතුය. මෙම ගැටළු විසඳීමෙන් සියළුම සිද්ධාන්ත සම්පූර්ණයෙන්ම ආවරණය කරගත හැකි මෙන්ම විභාග ප්‍රශ්න පත්‍රයේත් මෙවෙනීම ගැටළු ලැබෙන බැවින් විශ්වාසයෙන් විභාගයට මුහුණ දිය හැකිය.

මෙහිදී අන්තර්ගත කර ඇති සියළුම ප්‍රශ්න හරහා සංයෝජන, සංකරන, තර්කන රාමු, තල දර්පණ, කුලක, සීඝ්‍රතාවය, සංඛ්‍යා රටා, රූප රටා, අනුපාත, දාදු කැට, ඝනක, ප්‍රතිශත, මධ්‍යනය්‍ය, වයස සම්බන්ධ ගැටළු, වේගය, දිශා, භාෂාමය හැකියාව ඇතුළු අනු ඒකක ආවරණය වේ.

සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved

THARANGA GAMAGE
SMART LEARNING CENTER
සියලුම පන්ති පිළිබඳ තොරතුරු සඳහා පිවිසෙන්නේ අපගේ වෙබ් අඩවියට.
tharangagamage.lk 070 550 5387
IQ

අභියෝග්‍යතාවය ප්‍රශ්ණ පත්‍රය

01. අංක 1,2,3,4,5 ලෙස නම් කරන ලද ලිපිගොනු 5ක් ආයතනයක ලාච්චු-වක් තුල තැබිය යුත්තේ සෑම විටම, A සහ C ස්ථානවල ඇති ලාච්චු සඳහා ලිපිගොනුවල සටහන් කර ඇති අංකවල එකතුව, B සහ D ස්ථානවල ඇති ලාච්චු සඳහා ඇතුලත් කරන ලද ලිපිගොනු අංකවල එකතුවට සමාන වන පරිධිය. මේ ආකාරයට ලිපිගොනු තැබිය හැකි ආකාර ගණන කොපමණද? සෑම ලච්චුවකම තැබිය හැක්කේ එක් ලිපිගොනුවක් පමණි.



(1) 2 (2) 8 (3) 12 (4) 24

- අංක 02 සිට 04 තෙක් ප්‍රශ්න කාර්යාලයක තිබූ ලිපිගොනුවක් නැතිවීම පිළිබඳවයි. ඒ පිළිබඳ සැකයට භාජනය වූ හය දෙනෙක් වූහ. ඔවුහු නම් මලිත්, ලලිත්, නීලා,අචලා, ගීතා හා විනීතා වූහ. කාර්යාල සහකාර විසින් ඔවුන්ගෙන් ප්‍රශ්න කරන ලදී. එක් එක් අය දුන් පිළිතුර මෙසේ විය.
  මලිත් - එය තමා නොගත් බව කීවේය.
  ලලිත් - එය කාර්යාල කාර්යය සහායක ගත් බව කීවේය.
  නීලා - එය ගීතා ගත් බව කීවාය.
  අචලා - එය මාලා නමැත්තිය ගත් බව කීවාය.
  ගීතා - එය තමා නොගත් බව කීවාය.
  විනීතා - ගීතා සත්‍ය කී බව කීවාය.

  මොවුන් අතුරෙන් සත්‍ය ප්‍රකාශ කළේ දෙදෙනෙකු පමණි.අනෙක් හතර දෙනාගේම ප්‍රකාශ අසත්‍යය වේ. ඒ අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් වර්ණයෙහි අංකය අදාල තිත් ඉර මත ලියන්න.

02. සත්‍යය කී එක් අයෙකු නම්,
(1) නීලා ය. (2) මලිත් ය.
(3) අචලා ය. (4) විනීතා ය.

03. සත්‍යය කී අනිත් තැනැත්තා/ තැනැත්තිය නම්,
(1) නීලා (2) ගීතා
(3) අචලා (4) ලලිත්

04. ලිපිගොනුව සොරකම් කලේ,
(1) මලිත් (2) ලලිත්
(3) ගීතා (4) විනීතා

05. +, - , x, ÷ යන සංකේත 1, 2, 3, සහ 4 යන සංඛ්‍යා යොදාගන්නා අතර මෙහි දක්වා ඇත්තේ අනුපිළිවෙලින් නොවේ ප්‍රශ්ණාර්ත ලකුණ සඳහා ගැලෙපෙන අගය සොයන්න (තිරස් හෝ සිරස් අතට එකතුව සමාන වේ)

x	÷	-
÷	+	÷
-	÷	?

(1) 1 (2) 2 (3) 3 (4) 4

අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා පහත සඳහන් තොරතුරු මැනවින් හදාරා ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

- **C, E, J, L, M සහ N යනු සමාගමක පරිපාලන, මුදල්, සැලසුම්, මානව සම්පත්, තොරතුරු තාක්‍ෂණ හා ගබඩා යන විවිධ අංශ හයක සේවය කරන අධ්‍යක්‍ෂවරුන් හය දෙනෙක් වන නමුත් ඔවුන් සේවය කරන අංශ මෙහි දක්වා ඇති අනුපිළිවෙලට නොවේ.**

- **ඔවුන් එකම ගොඩනැගිල්ලේ 1, 2, 3, 4, 5 සහ 6 යනුවෙන් සමන්විත විවිධ මහල් 6ක සේවය කරන නමුත්, ඔවුන් සේවය කරන මහල් මෙහි ඉහත දක්වා ඇති අනුපිළිවෙලට නොවේ.**

- **"J" 3 වන මහලේ සේවය කරන අතර, ඔහු මානව සම්පත් හෝ සැලසුම් අංශයේ අධ්‍යක්‍ෂකවරයෙකු නොවේ. "E" සහ "M" පිළිවෙලින් පරිපාලන සහ තොරතුරු තාක්‍ෂණ අංශ වල අධ්‍යක්‍ෂකවරුන් වෙති. ගබඩා අංශයේ අධ්‍යක්‍ෂකවරයෙකු වන "C" මුදල් අංශයේ අධ්‍යක්‍ෂකවරයා සේවය කරන මහලට පහළ මහලේ සේවය කරයි. "L" සහ "N" පිළිවෙලින් 5 වන සහ 6 වන මහල් වල සේවය කරති. තොරතුරු තාක්‍ෂණ අංශයේ අධ්‍යක්‍ෂකවරයා 1 වන මහලේ සේවය කරයි. මානව සම්පත් අංශයේ අධ්‍යක්‍ෂකවරයා සේවය කරන්නේ ගබඩා අංශයේ අධ්‍යක්‍ෂකවරයා සේවය කරන මහලට මහල් දෙකක් ඉහළිනි.**

06. මානව සම්පත් අංශයේ සේවය කරන්නේ කවුද?

(1) L (2) N (3) J (4) C (……)

07. C සේවය කරන්නේ කුමන මහලේද?

(1) 2 (2) 4 (3) 5 (4) 6 (……)

08. මුදල් අංශයේ අධ්‍යක්‍ෂවරයාද?

(1) L (2) N (3) C (4) J (……)

09. N කුමන අංශයේ අධ්‍යක්‍ෂවරයාද?

(1) මානව සම්පත් (2) සැලසුම්
(3) මුදල් (4) දත්ත ප්‍රමාණවත් නොවේ. (……)

10. නිවැරදි වන්නේ පහත සඳහන් අධ්‍යක්‍ෂක හා අංශය යන සංයුති අතරෙන් කවර සංයුතියද?

(1) N – මානව සම්පත් (2) J – මුදල්
(3) N – මුදල් (4) L – සැලසුම් (……)

11. ළමයින් 3 දෙනෙක්ගේ ගණිත ලකුණුවල මධ්‍යන්‍ය 85 කි. ළමයින් 4 දෙනෙක්ගේ භෞතික විද්‍යාවේ ලකුණුවල මධ්‍යන්‍ය 90 කි. ළමයින් 2 දෙනෙක්ගේ රසායනික විද්‍යාවේ ලකුණුවල මධ්‍යන්‍ය 75 කි. සියළුම ළමයින්ගේ ලකුණුවල මධ්‍යන්‍ය?

(1) 65 (2) 75 (3) 85 (4) 95

12. ආයතනයක පැවැත්වීමට නියමිත උත්සවයක් සඳහා 7 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විශේෂාංගයක් ඉදිරිපති කිරීමට සැලසුම් කරන අතර කණ්ඩායමේ සියලුම දෙනා වෙන වෙනම තම ඉදිරිපත් කිරීම කරනු ලබයි. A1 සිට A7 දක්වා වූ සෑම පුද්ගලයෙක්ම පහත දී ඇති කල පරාසයන් තුල තම ඉදිරිපත් කිරීම කරනු ලබයි. එවිට ඒ සඳහා වෙන වෙනම මයික් යෙ-ාදාගැනීමට අවශ්‍ය අතර එම විශේෂාංගය සඳහා ලබාගත යුතු අවම මයික් ගන්න සොයන්න.

A 1 පුද්ගලයා : ආරම්භ කිරීම 09:00 AM අවසන් කිරීම 09:30 AM
A2 පුද්ගලයා : ආරම්භ කිරීම 09:10 AM අවසන් කිරීම 09:50 AM
A3 පුද්ගලයා : ආරම්භ කිරීම 09:20 AM අවසන් කිරීම 10:00 AM
A4 පුද්ගලයා : ආරම්භ කිරීම 09:40 AM අවසන් කිරීම 10:10 AM
A5 පුද්ගලයා : ආරම්භ කිරීම 10:00 AM අවසන් කිරීම 10:30 AM
A6 පුද්ගලයා : ආරම්භ කිරීම 10:05 AM අවසන් කිරීම10:45 AM
A7 පුද්ගලයා : ආරම්භ කිරීම 10:20 AM අවසන් කිරීම 11:00 AM

(1) 1 (2) 2 (3) 3 (4) 4

අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න, සමලා, මානිත්, රෝහිත, අමිතා, ගෞරි, ප්‍රීති හා ප්‍රියා නැමැති යහළු යෙහෙළියන් සත් දෙනෙක් රවුම් සයක් වටා අසුන්ගෙන සිටින ආකාරය සම්බන්ධයෙන් වන පහත තොරතුරු මත පදනම් වේ.

- මොවුන් අතුරින් ගෞරි හැර අන් සියල්ලන් ම එකිනෙකා එක එල්ලේ මුහුණ ලා සිටින සේ සමදුරින් අසුන්ගෙන සිටිති.
- රෝහිත, ප්‍රියාට දකුණු පසින් දෙවැන්න ලෙස අසුන්ගෙන සිටී.
- ප්‍රීති අසුන්ගෙන සිටින්නේ අමිතාට ආසන්නයේ ළඟින්ම වම් පසිනි.
- කමලා, ගෞරිට 90^0 කින් ද මානිත්ට 120^0 කින් ද වන දිශාවකින් අසුන් ගෙන සිටී.
- මානත් අසුන්ගෙන සිටින්නේ ප්‍රියාට එක එල්ලේ මුහුණලා හරියට ඉදිරියෙනි. ඔහු ගෞරිගේ දකුණු පසින් ආසන්නයේ ළඟින්ම වේ.

මෙම තොරතුරු වලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න

13. රෝහිත හා මානිත් අතර අසුන් ගෙන සිටින්නේ කවරෙක් ද!
(1) ප්‍රීති (2) අමිතා (3) ගෞරි (4) කමලා (………..)

14. එකිනෙකාට එක එල්ලේ මුහුණලා හරියට ම ඉදිරියෙන් අසුන්ගෙන සිටින දෙදෙනෙකු වන්නේ පහත කවුරුන්ද?
(1) රෝහිත හා ප්‍රිතී (2) අමිතා හා කමලා
(3) ප්‍රිතී සහ ගෞරි (4) රෝහිත හා අමිතා (………..)

15. ගෞරිට 90^0 කින් ද රෝහිතට 120^0 කින් ද වන දිශාවසින් අසුන්ගෙන සිටින්නේ කවරෙක්ද?
(1) ප්‍රීති (2) අමිතා (3) කමලා (4) ප්‍රියා (………..)

16. දෙවනුවට සඳහන් තැනැත්තා, පළමුවට සඳහන් තැනැත්තාට වම් පසින් අසුන්ගෙන සිටින්නේ පහත කවර යුගලයෙ ද?
(1) ප්‍රිතී - අමිතා (2) කමලා - ප්‍රියා
(3) රෝහිත - ගෞරි (4) මානිත් - ප්‍රති (………..)

17. එක් වෙළඳපල හිමියෙක් රු 120000 සඳහා ටෙලෙවිෂන් එකක් මිලදී ගෙන එය 40% කින් මිල වැඩි කර සටහන් කරයි. අලවියේදී 25% ක වට්ටමක් ලබා දෙයි. අවසාන විකුණුම් මිල කොපමණද, සහ සම්පූර්ණ ලාභය හෝ පාඩු ප්‍රතිශතය කුමක්ද?

(1) 5% (2) 10% (3) 15% (4) 20%

අංක 27 සිට 32 ක් ප්‍රශ්න වලට පිළිතුරු සෙවීමට ඇති සංඛ්‍යා කණ්ඩ බලන්න.

නිදසුනේ දැක්වෙන ප්‍රථම අනුවරහන් තුළ ඇති සංඛ්‍යා පේළි හා තිර දෙවැනි අනුවරහන තුළ ඇති සංඛ්‍යා පේළි හා තිර සමග එක්තරා රටාවකට එකතු කර ඇත. එසේ ලැබෙන සංඛ්‍යා කිසියම් රටාවකට තෙවැනි අනුවරහනේ ලියා ඇත.

$$\begin{bmatrix} 3 & 5 \\ 6 & 7 \end{bmatrix} + \begin{bmatrix} 1 & 4 \\ 3 & 2 \end{bmatrix} = \begin{bmatrix} 4 & 8 \\ 10 & 9 \end{bmatrix}$$

පහත දැක්වෙන අනුවරහන් තුළ සංඛ්‍යා ද ඒ රටාවට ම ලියා ඇත. ඒ අනුව අකුරු යොදා ඇති කොටුවල තිබිය යුතු සංඛ්‍යා සොයන්න.

$$\begin{pmatrix} 1 & 2 & 5 & 3 \\ 2 & \textcircled{A} & 4 & 2 \\ 3 & 4 & 3 & 1 \\ 4 & 1 & \textcircled{B} & 4 \end{pmatrix} + \begin{pmatrix} 3 & \textcircled{C} & 4 & 1 \\ 2 & 3 & 3 & 2 \\ 1 & 4 & 5 & 3 \\ 3 & 2 & \textcircled{D} & 4 \end{pmatrix} = \begin{pmatrix} 4 & \textcircled{E} & 6 & 6 \\ 7 & 6 & 8 & 4 \\ 7 & 7 & \textcircled{F} & 2 \\ 5 & 3 & 5 & 8 \end{pmatrix}$$

18. A (1) 4 (2) 3 (3) 5 (4) 6 (………..)

19. B (1) 7 (2) 3 (3) 3 (4) 4 (………..)

20. C (1) 5 (2) 8 (3) 2 (4) 6 (………..)

21. D (1) 3 (2) 5 (3) 1 (4) 4 (………..)

22. E (1) 4 (2) 7 (3) 6 (4) 8 (………..)

23. F (1) 4 (2) 5 (3) 3 (4) 8 (………..)

24. වසර දහයකට පෙර A ගේ වයස B ගේ වයස අතර අනුපාතය 3:5 විය. අද එම අනුපාතය 5:7 කි. ඔවුන්ගේ වර්තමාන වයස සොයන්න.

(1) 1 (2) 2 (3) 3 (4) 4

25. රූපයෙහි දී ඇති පතරොම භාවිත කර නිර්මාණය කළ හැකි ඝනකයෙහි එකිනෙකට ප්‍රතිවිරුද්ධ මුහුණත්වල දැකිය හැකි වන්නේ පහත දැක්වෙන කවර යුගලය ද?



(1) ✶ සහ ○ **(2)** ✶ සහ □

(3) △ සහ ✚ **(4)** ◇ සහ □

(5) △ සහ □

අංක 26 සිට 30 දක්වා ප්‍රශ්න එක්තරා ආයතනයක ආරම්භකරන ලද ව්‍යාපෘතියකට අදාල පහත වගුවෙහි දැක්වෙන තොරතුරු මත පදනම් වේ

සිදුවීම	දිනය	සතියේ දිනය	වාර්ෂික දින අංකය	සටහන
ඉලක්ක නිර්වචනය	2026 ජන 05	සඳුදා	05	පළමු රැස්වීම
ව්‍යාපෘති සිතියම නිර්මාණය කිරීම.			20	දෙවන රැස්වීම
ව්‍යාපෘතය ක්‍රියාත්මක කිරීම.	2026 පෙබ 11			තුන්වන රැස්වීම
අධීකෂණය සහ පාලනය			57	හතරවන රැස්වීම
අවසන් කිරීම.	2026 මාර් 03			පස්වන රැස්වීම
පවත්වාගෙන යාමට සැලසුම්.		බදාදා		පළමු රැස්වීම

26.. ව්‍යාපෘතිය සිතියම නිර්මාණය කරනු ලබන්නේ ජනවාරි මාසයේ කවදාදා

(1) 10 (2) 15 (3) 20 (4) 25

27.. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ වාර්ෂික දින අංක කීය යටතේ ද

(1) 32 (2) 42 (3) 52 (4) 62

28.. අධීක්ෂණය හා පාලනය සිදු වන්නේ කුමන මාසයේ ද

(1) පෙබරවාරි (2) මාර්තු (3) අප්‍රේල් (4) මැයි

29. 2026 ජන 20 (ව්‍යාපෘති ආරම්භය) දින සිට සෑම 11 වන දිනකම සජීවී පුහුණුවක් ලබා දෙන්නේ නම්, 4වන පුහුණු සැසිය පැවැත්වෙන්නේ කුමන දිනයද?

(1) සදුදා (2) අගහරුවාදා (3) බදාදා (4) බ්‍රහස්

30. ව්‍යාපෘතියෙ ආරම්භක දිනයත් අවසාන දනයත් අතර හරි මැද දිනයක විශේෂ සාකච්චාවක් ආයතන ප්‍රධානයා යටතේ පැවැත්වෙන අතර එම දිනය සතියේ කවර දිනයක් වේ ද

(1) සදුදා (2) අගහරුවාදා (3) බදාදා (4) බ්‍රහස්

අංක 91 සිට 95 ක් ප්‍රශ්න, කිසියම් සංකේත පහක් භාවිතයෙන් ලියා ඇති ප්‍රකාශ සහ නිගමන කිහිපයක් සම්බන්ධයෙන් වන පහත තොරතුරු මත පදනම් වේ.

❖ එක්තරා කේතකරණයකදී @, #, $, * හා % යන සංකේත සම්මත ව්‍යවසාරයෙන් බැහැරව පහත නිදසුනේ දැක්වෙන පරිදි අර්ථ නිරූපණය කෙරේ.

නිදසුන :- P@Q → P, Q වඩා අඩු නොවේ.

P # Q → P, Q වඩා නොවැඩි ද සමාන ද නොවේ.

P$ Q → P, Qට වඩා නොඅඩු ද නොවැඩි ද නොවේ.

P* Q → P, Q ට වඩා වැඩි නොවේ.

P%Q → P, Q ට වඩා අඩු හෝ සමාන හෝ නොවේ.

❖ එම අර්ථ නිරූපණයට අනුව ඒ ඒ සංකේත භාවිතයෙන් ලියන ලද (a), (b) හා (c* වශයෙන් වූ කිසියම් ප්‍රකාශ තුනක් හා එම ප්‍රකාශ පදනම් කරගෙන එළැඹිය හැකියැයි අපේක්ෂිත I හා II වශයෙන් වූ නිගමන දෙකක් බැගින් පහත එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇත.

❖ ඒ අනුව දෙන ලද එම ප්‍රකාශ තුන පමණක් පදනම් කරගෙන නිශ්චිත වශයෙන් ම එම නිගමන දෙක අතුරින්,

➢ I නිගමනයට පමණක් එළැකිය හැකි වන්නේ නම් අංක 1 ද,

➢ II නිගමනයට පමණක් එළැඹිය හැකි වන්නේ නම් අංක 2 ද

➢ I හා II යන කියමන දෙකටම එළැඹිය හැකි වන්නේ නම් අංක 3 ද,

➢ I හා II සිසිදු නිගමනයකට එළැඹිය නොහැකි වන්නේ නම් අංක 4 ද,

• එක් එක් ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

31. ප්‍රකාශය : (a) M $ K (b) D # K (c) R * K

නිගමන : I. D $ M

II. M % R (………….)

32. ප්‍රකාශය : (a) F * M (b) M # R (c) B @ F

නිගමන : I. M % E

II. R @ E (………….)

33. ප්‍රකාශය : (a) H * K (b) T # H (c) W * T

නිගමන : I. T # K

II. K % W (………….)

34. ප්‍රකාශය : (a) N % A (b) A # L (c) F $ N

නිගමන : I. L % F

II. F % A (………….)

35. ප්‍රකාශය : (a) B * D (b) D $ M (c) F % M

නිගමන : I. B * M

II. F % B (………….)

36. . පහත දැක්වෙන කුමන වෙන් රූප සටහන පිරිමි, පියවරු සහ ගුරුවරු අතර සම්බන්ධය පෙන්නුම් කරයිද



(1) (2) (3) (4)

පණිවිඩකරුවෙකු තැපැල් කාර්යාලයෙන් **(P)** පිටව ගොස්, ලියුම් පාසල **(S)**, බැංකුව **(B)** සහ සායනය **(C)** වෙත සහ සති පෙළ **(M)** යන ස්ථානවලට භාර දී පසුව **(P)** වෙත යා යුතුය.



37. පෙන්වා ඇති ඕනෑම මාර්ග ඔස්සේ එක් වරක් පමණක් ගමන් කර තැපැල් කාර්යාලයට යා හැකි කෙටිතම දුර කොපමණද

(1) 35 m (2) 34 m (3) 28 m (4) 26 m

38. එකිනෙකට ලම්භකව ගමන් ගන්නා මාර්ග දෙකක් **M** ස්ථානයේ දී හමු වීමෙන් හතරමං හන්දියක් සෑදී ඇත. පියුම් මහතා උතුරු දිශාවට යොමු වී ඇති **C** වෙත **M** සිට ගමන් කරයි නම්, **M** ට සාපේක්ෂව **B** පිහිටා ඇත්තේ කුමන දිශාවෙන් ද

(1) නැගෙනහිර (2) උතුර (3) දකුණ (4) බටහිර

39. අළුත් මැෂින් එකක් පැයකට පත්‍රිකා 600 මුද්‍රණය කළ හැක, පැරණි මැෂින් එකක් පැයකට 400 පත්‍රිකා මුද්‍රණය කළ හැක. දෙකම එකට වැඩ කළහොත්, 5,000 පත්‍රිකා මුද්‍රණය කිරීමට කොපමණ කාලයක් ගතවනු ඇතද?

(1) පැය 2 (2) පැය 3 (3) පැය 4 (4) පැය 5

- පහත ප්‍රශ්න දී ඇති ගැලීම් සටහන මත පදනම් වී ඇත. මම ගාල්ලේ පිහිටි යහලුවාගේ නිවස බලා යාමට පිටත් වීමි. මුලින්ම බස් නැවතුම් පළ බලා යන මා ගාල්ල බලා යන බසයක් තිබුණහොත් බසයෙන් යහලුවාගේ නිවස බලා යමි. ගාල්ල බලා යන බසයෙන් යහලුවාගේ නිවස බලා යමි. ගාල්ල බලා යන බසයක් නොතිබුණහොත් දුම්රිය නැවතුම් පළට ගොස් දුම්රියකින් ගාල්ලට යමි. දුම්රියක් ද නොතිබුණහොත් වෙනත් දිනයක සයහලුවාගේ නිවසට යාම සඳහා ආපසු පැමිණීමට මට සිදුවනු ඇත. පහත ගැලීම් සටහනේ A, B, C, D, E, F, G, H යන අක්ෂර වලින් නිරූපණය වන කෘත්‍යයන් පහත දක්වා ඇත. (අනුපිළිවලට නොවේ)

1. දුම්රියෙන් යාම
2. බස් නැවතුම්පළට යාම
3. දුම්රිය නැවතුම්පළට යාම
4. නිවසින් පිටත්වීම
5. දුම්රිය තිබේ
6. දුම්රියක් නැත
7. බසයෙන් යාම
8. අවසානය



පහත දී ඇති එක් එක් අකෂරයට ගැලෙපෙන අවස්ථාවට ආදාල අංකය තෝරන්න

40. D අක්ෂරය

(1) 3 (2) 4 (3) 5 (4) 6

41. C අක්ෂරය

(1) 1 (2) 2 (3) 3 (4) 4

42. F අක්ෂරය

(1) 4 (2) 5 (3) 6 (4) 7

43. B අක්ෂරය

(1) 1 (2) 2 (3) 3 (4) 4

44. H අක්ෂරය

(1) 1 (2) 2 (3) 3 (4) 4

45. හේෂාන් නිවසින් පිටත් වී 5 kmh^{-1} නියත වේගයෙන් පාසල තෙක් ගමන් කළේය. ඔහුගේ සොහොයුරා හේෂාන් පිටත් වූ වේලාවට වඩා මිනිත්තු 12ක් ප්‍රමාදව නිවසින් පිටත්ව 15 kmh^{-1} නියත වේගයෙන් එම පාසලට ලඟාවිය. ඔවුන් දෙදෙනාම පාසලට ලඟාවූයේ එකම මොහොතක නම්, ඔවුන්ගේ නිවසේ සිට පාසලට ඇති දුර කොපමණද?

(1) 5 km (2) 2.5 km (3) 2 km (4) 1.5 km (5) 1 km

අංක 31 සිට 35 තෙක් ප්‍රශ්න පහත දැක්වෙන ඉංග්‍රීසි වචන අට හා ඒ සම්බන්ධයෙන් වන තොරතුරු මත පදනම් වේ.

- ❖ මෙම පහත දක්වා ඇති ඉංග්‍රීසි වචන අට තුළ ඉංග්‍රීසි අකුරු දහයක් අන්තර්ගත වී තිබේ. එම සෑම ඉංග්‍රී අකුරක් සඳහා ම 0 සිට 9 තෙක් වූ කිසියම් අගයක් බැගින් ලබා දී ඇත
- ❖ ඒ අනුව සෑම ඉංග්‍රිසි වචනයකම අඩංගු සියලුම අකුරු සඳහා වන ඒ ඒ අගයන් හී එකතුව, වචනයේ අග ලෙස එක් එක් වචනයට ඉදිරියෙන් පහත දක්වා ඇත.

CAKES – 10	TEAK – 13	CAT – 10	ERB - 18
BRAVE – 23	BEHAVE – 35	TEAM -18	MEEK -15

- ❖ එහි දී සෑම ඉංග්‍රීසි වචනයකම හි ඇතුළත් A අකුර සඳහා ලබා දී ඇති අගය 3 කි.
- ❖ තව ද මෙහි දී ඕනෑම එක් අගයකින් නියෝජනය කළ හැක්කේ එක් ඉංග්‍රීසි අක්ෂරයක් පමණි.

මෙම තොරතුරු වලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්න ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

46. C, T අකුරු දෙකේ අගයන් පිළිවෙළින් මොනවාද?

(1) 4,2 (2) 2,5 (3) 5,2 (4) 6,1 (………..)

47. E, B, M අකුරු තුනේ අගයන් පිළිවෙළින් මොනවාද?

(1) 4,7,6 (2) 7,4,6 (3) 2,4,8 (4) 4,8,6 (………..)

48. H, V, R අකුරු තුනේ අගයන් පිළිවෙළින් මොනවාද?

(1) 0,9,8 (2) 8,9,0 (3) 8,0,9 (4) 9,8,0 (………..)

49. REACH යන පදයේ අගය කීයද?

(1) 10 (2) 14 (3) 16 (4) 17 (………..)

50. KRATE යන පදයේ අගය කියද?

(1) 8 (2) 12 (3) 13 (4) 15 (………..)

සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved

THARANGA GAMAGE
SMART LEARNING CENTER
සියලුම පන්ති පිළිබඳ තොරතුරු සඳහා පිවිසෙන්නේ අපගේ වෙබ් අඩවියට.
tharangagamage.lk 070 550 5387
IQ

අභියෝග්‍යතාවය ප්‍රශ්ණ පත්‍රය

- අංක 01 සිට 02 තෙක් ප්‍රශ්න එක්තරා ආයතනයක 2026 ජනවාරි 20 වන දිනට නියමිත සැලසුම් කරනලද පළමු රැස්වීමේ දිනය අත්‍යවශ්‍ය හේතුවක් මත හරියටම සති 18 කට පසුව එළඹෙන දිනයේ පැවැත්විය යුතු බව විධායක කමිටුව යෝජනා කරයි. යම් හෙයකින් එම දිනයද කල්ගියහොත් ඊට සුදුස් ආසන්නතම ඊළඟ මාසයේ දිනයක් තෝරාගත් යුතු වේ. එවිට මුලින්ම රැස්වීම පැවැත්වීමට නියමිතව තිබූ සතියේ එම දිනයම තෝරාගත යුතුය. කෙසේ වෙතත් සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 15 ට වඩා අඩු දිනයක උත්සවය පැවැත්විය නොහැකිවේ. (ජනවාරි 20 වන දින අඟහරුවාදා දිනයක් බව උපකල්පනය කරන්න.)

මෙම වර්ෂයේ ඉදිරි දින සඳහා අපේක්ෂිත උෂ්ණත්වය ඇතුලත් ප්‍රස්ථාරයක් පහත රූප සටහනෙහි පෙන්වා ඇත.

මාසය	ජන	පෙබ	මාර්	අප්‍රේ	මැයි	ජුනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නො	දෙසැ
උෂ්ණත්වය ^0C	18	17	16	16	14	13	13	14	13	16	15	17

01 මෙම තත්වය මත රැස්වීම පැවැත්වෙන මාසය වනුයේ ?

1. අගෝස්තු 1. සැප්තැම්බර් 1. ඔක්තෝම්බර් 1. නොවැම්බර්

02 මෙම තත්වය මත රැස්වීම පැවැත්වෙන්නේ අදාල මාසයේ කී වැනි දිනයේ දී ද ?

1. 9 1. 12 1. 15 1. 16

- අංක 03 සිට 07 තෙක් ප්‍රශ්න එක්තරා ආයතනයක පැවැත්වීමට නියමිත උත්සවයක කටයුතු ග්‍රාමීය ව්‍යාපාරික පුද්ගලයෙකුට භාර දී ඇත. එම ව්‍යාපරය හිමි පුද්ගලයා විසින්, වැඩසටහන් මෙහෙයවීම , ලිපිගොනු සැකසීම , ප්‍රවාහන පහසුකම් සැපයීම, අන්තර්ජාල මෙහෙයුම් පාලනය , ආහාර , ශබ්ධ පරිපාලනය හා ශාලා පහසුකම් සැපයීම යන අංශ භාර දී ඇති ඇති P, Q, R, S, T , U හා V යන පුද්ගලයින පිළිබඳ විස්තරය පහත පරිදි වේ.

- එක් පුද්ගලයකුට ලබා දී ඇත්තේ එක් කාර්යයක් පමණි.
- මොවුන් අතර දෙදෙනෙක් සොහොයුරෝ වෙති. දෙදෙනෙක් සොයුරියන් වේ. ඉතිරි දෙදෙනා
- පියෙක් හා පුතෙක් වේ.
- U ගේ පවුලේ වෙනත් කිසිවෙක් නැත.
- V ට සොයුරන් හෝ සොයුරියන් නැත.
- R, T ගේ අයියා වන අතර ආහාර යන කොටස භාර දී ඇත්තේ මොහුටය..
- ප්‍රවාහන පහසුකම් සැපයීම් කරන පුද්ගලයාගේ අක්කා අන්තර්ජාල මෙහෙයුම් පාලනය පිළිබඳ ව සොයා බලනු ලැබේ.
- Q වැඩසටහන් මෙහෙයවීම පිළිබඳ සොයා බලනු ලැබේ.
- ශාලා පහසුකම් සැපයීම හෝ ලිපිගොනු සැකසීම U ට ලබා දී නොමැත.

මෙම තොරතුරු වලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරාන්න

03 නිශ්චිතව ම එකම පවුලට අයත් දෙදෙනෙක් වන්නේ කවුරුන්ද?

1. Q/T 2. P/T 3. P/S 4. Q/R

04 ආහාර පිළිබඳ කොටස ලබා දී ඇත්තේ කාටද?

1. Q 2. S 3. T 4. U

05. ශාලා පහසුකම් සැපයීම ලබා දී ඇත්තේ කාටද?

1. නිශ්චිතවම T හෝ V ට ය
2. නිශ්චිතවම T හෝ V ට නොවේ ය
3. නිශ්චිතවම T හෝ S ට ය
4. නිශ්චිතවම T හෝ S ට නොවේ ය

06. S ට ලබා දී ඇති අංශය කුමක්ද?

1. ශාලා පහසුකම්
2. ආහාර
1. වැඩසටහන් මෙහෙයවීම
2. අන්තර්ජාල මෙහෙයුම් පාලනය

07. සොයුරන් දෙදෙනාගෙන් එක් අයෙක් වන්නේ?

1. P 2. Q 3. S 4. T

09 එක්තරා ආයතනයක පැවැත්වෙන වාර්ෂික සමුළුවක් සඳහා මුල්‍ය අධ්‍යක්ෂ (B) සහභාගී වන්නේ නම්, නියෝජ්‍ය ලේකම් (D) ද සහභාගී විය යුතුය. මුල්‍ය අධ්‍යක්ෂ (B) සහභාගී නොවන්නේ නම් පමණක් ප්‍රතිපත්ති විශ්ලේෂක (P) සහභාගී වේ. නියෝජ්‍ය ලේකම් (D) සහභාගී නොවන්නේ නම්, සන්නිවේදනය සම්බන්ධ නිලධාරියා (C) සහභාගී විය යුතුය. සන්නිවේදන නිලධාරියා (ක) සහභාගී වේ, නැතහොත් පුහුණු සම්බන්ධීකාරක (T) යන දෙදෙනාගෙන් එක් අයෙක් පමණක් සහභාගී වේ. පුහුණු සම්බන්ධීකාරක (T) සමුළුවට සහභාගී වන්නේ නම්, පහත සඳහන් දේවලින් සත්‍ය විය යුත්තේ කුමක්ද?

(1) A, ප්‍රතිපත්ති විශ්ලේෂක (P) සහභාගී නොවේ.
(2) B, මුල්‍ය අධ්‍යක්ෂ (B) සහභාගී වේ.
(3) C. නියෝජ්‍ය ලේකම් (D) සහභාගී නොවේ.
(4) D, ප්‍රතිපත්ති විශ්ලේෂක (P) සහභාගී වේ.
(5) E, සන්නිවේදන නිලධාරියා (C) සහභාගී වේ.

10 මෙම කොටු ජාලයට 1 සිට 16 දක්වා ඇති අංක එක්වරක් පමණක් යොදාගෙන පිරවූ විට සෑම පේළියකමල තීරුවකම හො විකර්ණයක ඇති සංඛ්‍යාවල එකතුව සමානවේග එසේ පිරවූ පසු මුලු හතරෙහි ඇති සංඛ්‍යාවල එකතුව වනුයේ

(1) 12
(2) 15
(3) 18
(4) 25
(5) 32

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න "A,B" C" D" E" F හා G නැමැති පුද්ගලයන් හත්දෙනෙක් අනුපිළි-වෙළකින් තොරව සුදු, රතු, කළු, කොළ, කහ, නිල් හා දම් පැහැති කමිස වලින් සහ සුදු, රතු, නිල්, කළු, රන්වන්, කහ හා රිදී පැහැති කලිසම් වලින් සැරසී සිටින ආකාරය සම්බන්ධයෙන් වන පහත තොරතුරු මත පදනම් වේ.

  - D කොළ පැහැති කමීසයක් ද රිදී පැහැති කලිසමක් ද හැඳ සිටී.
  - A ගේ කමීසවත්, F කලිසමත් එකම වර්ණයෙන් වෙයි.
  - E ගේ කමීසයත්, B ගේ කලිසමත් එකම වර්ණයෙන් වෙයි.
  - G නිල් කමිසයකින් ද E නිල් කලිසමකින් ද සැරසී සිටී.
  - රතු කමිසයකින් සැරසී සිටින B ගේ කලිසම රන්වන් හෝ කහ පැහැති නොවේ.
  - F කිසිදා සහ වර්ණයෙන් යුත් ඇඳුම් නොඇදී.
  - A හැඳ සිටින්නේ සුදු කමිසයක් හෝ කහ කලිකමක් නොවේ.

තවද කිසිවෙක් කමීසය හා කලිසම රතු හා කහ සංයෝජනයෙන් නොඅදියි. එමෙන්ම එකම වර්ණයෙන් යුත් කමිසයක් හා කලිසමක් ද නොඅදියි

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය තෝරන්න.

11 දම් පැහැති කමිසයක් හැඳ සිටින්නේ කවරෙක් ද?

1. A 2. C 3. E 4. F

12 A හැඳ සිටින කලිසමේ වර්ණය කුමක් ද?

1. සුදු 2. කළු 3. රතු 4. රතු හෝ කළු

13 එකම වර්ණයෙන් යුත් ඇඳුම් යුගලයක් වන්නේ පහත කවරක් ද?

1. A ගේ කමිසය සහ B ගේ කලිසම
2. C ගේ කමිසය සහ E ගේ කලිසම
3. C ගේ කමිසය සහ G ගේ කලිසම
4. A ගේ කමිසය සහ G ගේ කලිසම

14 මෙම පිරිසේ සිටින කිසිම පුද්ගලයෙකු හැඳ සිටින ඇඳුම් කට්ටලයක් නොවන්නේ මින් කුමක්ද?

1. කළු කමිසය හා රතු කලිසම
2. සුදු කමිසය හා කළු කලිසම
3. නිල් කමිසය හා කහ කලිසම
4. කහ කමිසය හා රන්වන් කලිසම

15 මෙම පිරිස හැඳ සිටින ඇඳුම් සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත කවර ප්‍රකාශයද?

1. A කහ පැහැති කමිසයකින් හා සුදු පහැති කලිසමකින් සැරසී සිටී
1. B රතු පැහැති කමිසයකින් හා කළු පහැති කලිසමකින් සැරසී සිටී
1. C කහ පැහැති කමිසයකින් හා රන්වන් පහැති කලිසමකින් සැරසී සිටී
1. E කළු පැහැති කමිසයකින් හා නිල් පහැති කලිසමකින් සැරසී සිටී

16 ඔබට හැඩයෙන් එක හා කාසි 9ක් දී ඇති අතර, ඉන් එකක් අනෙක් ඒවාට වඩා තරමක් සැහැල්ලු ය. අනෙක් සියලුම කාසි 8 බරින් හරියටම සමාන වේ. තරදියකින්, සැහැල්ලු කාසිය හඳුනා ගැනීම සඳහා අවශ්‍ය අවම කිරුම් ගණන කොපමණද?

1. 1 2. 2 3. 3 4. 4

● අංක 17 සිට 22 දක්වා ප්‍රශ්න පහත දැක්වෙන් තොරතුරු මත පදනම් වේ. මුද්‍රිත කාඩ්පත් 12ක් අතුරෙන් 4ක් රතු පාටින් ද 4ක් නිල් පාටින් ද 4 ක් කොළ පාටින් ද යුක්ත වෙයි. ඒවා මුණින් නවා ගෙඩවල් තුනක තබා ඇත්තේ එක් ගොඩක තුනක් රතු ද එකක් නිල් ද අනෙකේ දෙකක් නිල් ද දෙකක් කොළ ද වන පරිදිය.

ඒ එක් එක් ගොඩකින් කාඩ් පත් දෙක බැගින් ගත් කල ඒවා රතු දෙකක් ද නිල් දෙකක් ද කොළ දෙකක් ද විය. ඒ අනුව මෙයින් කවරක් සත්‍ය විය හැකිද?

A. රතු ලැබුණු ගොඩයෙහි ඉතිරි දෙක ද රතු විය.

B. නිල් ලැබුණු ගොඩයෙහි ඉතිරි දෙක කොළ විය යුතුය.

C. කොළ ලැබුණු ගොඩයෙහි ඉතිරි දෙක නිල් විය යුතුය.

17 මෙයින් සත්‍ය විය හැක්කේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) B හා C පමණි. (………..)

ඒ එක් එක් ගොඩකින් කාඩ්පත් දෙක බැගින් ගත් කල ඒවා රතු හා නිල් ද නිල් හා කොළ ද රතු හා කොළ ද විය. ඒ අනුව මෙයින් කවරක් සත්‍ය විය හැකිද?

A. රතු හා නිල් යුගලය ලද ගොඩේ අනෙක් දෙක වර්ණ දෙකක විය යුතුය.

B. නිල් හා කොළ යුගලය ලද ගොඩේ අනෙක් දෙක ද නිල් හා කොළ විය යුතු ය.

C. රතු හා කොළ යුගලය ලද ගොඩේ අනෙක් දෙකින් එකක් නිල් විය යුතු ය.

18 මෙයින් සත්‍ය විය හැක්කේ,

(1) A හා B පමණි. (2) A හා B පමණි.

(3) A හා B පමණි. (4) A හා B පමණි. (………..)

19 ගොඩවල් දෙකකින් කාඩ්පත් දෙක බැගින් ගත් කල ඒවා රතු හා නිල් ද නිල් හා කොළ ද විය. ඒ අනුව මෙයින් කවරක් සත්‍ය වේද?

A. රතු හා නිල් කාඩ්පත් ලබාගත් ගොඩේ ඉතිරි දෙක එකම වර්ණයක් විය යුතුය.

B. නිල් හා කොළ කාඩ්පත් ලබාගත් ගොඩේ ඉතිරි දෙක එකම වර්ණයෙන් විය යුතුය

C. නිල් හා කොළ කාඩ්පත් ලබාගත් ගොඩේ ඉතිරි කාඩ්පත් එකක් කොළ වර්ණයක් විය යුතු ය.

20 මෙයින් සත්‍යය වන්නේ

(1) A හා B පමණි. (2) B හා C පමණි.

(3) A හා C පමණි. (4) A ,B, C තුනම (………..)

21 ගොඩවල් දෙකකින් කාඩ්පත් යුගලය බැගින් ලබාගත් කල ඒ එක් එක් යුගලය එකම වර්ණයෙන් යුක්ත විය යුතුය. ඒ අනුව කාඩ් පත් ලබා නොගත් ගොඩේ,

A. සමාන වර්ණ කාඩ්පත් යුගලයක් තිබිය යුතුය

B. සමාන වර්ණ කාඩ්පත් යුගල දෙකක් තිබිය හැකියි

C. තෝරාගත් යුගල දෙක එකම වර්ණයෙන් වූයේ නම් තෝරා නොගත් ගොඩේ රතුපාට කාඩ් පත් තුනක් තිබිය යුතුය

මින් සත්‍ය විය හැක්කේ

(1) A පමණි. (2) B පමණි.

(3) C පමණි. (4) A, B, C තුනම (………..)

22. එක් ගොඩකින් කාඩ් පත් දෙකක්ද තවකකින් එකක්ද ලබා ගත්විට ඒවා එකට එකක් වෙනස් වර්ණ වූයේ නම් කාඩ් පත් නොගත් ගොඩේ,

(1) වර්ණ තුනම තිබිය නොහැකිය

(2) වර්ණ දෙකක් පමණක් තිබිය හැකිය

(3) එකම වර්ණයෙන් කාඩ් පත් තුනක් තිබිය නොහැකිය

(4) එකම වර්ණයෙන් කාඩ් වත් දෙකක් තිබිය නොහැකිය (………..)

- අංක 23 සිට 27 තෙක් ප්‍රශ්න ආයතනයක ලොග් සටහන් පොතක් අනපේක්ෂිත ලෙස අස්ථාන ගතවී ඇති අතර ඒ පිළිබඳව සැකයට පාත්‍ර වූ පුද්ගලයන් පස් දෙනෙකුගෙන් ප්‍රශ්න කරනු ලැබීය ඔවුන් නම් පාලි බාලි මාලි රානි සහ ටානි වූහ.

ඔවුන්ගේ පිළිතුරු වූයේ,

එය තමා නොකළ බව පාලි කීවේ ය.
එය බින්දේ බාලි බව මාලි කීවේය.
බාලි කීවේ එය බින්දේ මාලි බව ය.
එය කරන්නට ඇත්තේ පාලි හෝ මාලි බව ටානි කීවේ ය.
රානි කීවේ එය ටානි හා පාලි එක්ව කළ බව ය.

ඉහත තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

23. ඉහත ප්‍රකාශ අතුරින් එකක් පමණක් සත්‍ය නම්, පහත සඳහන් අය අතුරෙන් ලොග් පොත ගන්නට ඇත්තේ කවරෙක්ද?

1. බාලි 2. මාලි 3. මාලි හෝ බාලි 4. ටානි

24. ප්‍රකාශ අතුරින් දෙකක් පමණක් සත්‍ය නම්, එය කරන්නට ඇත්තේ කවරෙක්ද?

1. බාලි 2. මාලි 3. ටානි 4. පාලි

25. ප්‍රකාශ අතුරින් තුනක් පමණක් සත්‍ය නම්, එය කරන්නට ඇත්තේ කවරෙක්ද?

1. බාලි 2. මාලි 3. ටානි 4. පාලි

26. ඉහත ප්‍රකාශ සිදු කළ පුද්ගලයන් අතුරින් එක් අයෙකු පමණක් පොත ගත් සිද්ධියට සම්බන්ධ නම් එම ප්‍රකාශ අතුරින් එකක් පමණක් සත්‍ය වී ඉතිරි සියල්ල අසත්‍ය වන අවස්ථා කීයක් තිබේද?

1. 1 2. 2 3. 3 4. 4

27. ඉහත ප්‍රකාශ සිදු කළ ළමයින් අතුරින් එක් අයෙකු පමණක් පොත ගත් සිද්ධියට සම්බන්ධ නම් එම ප්‍රකාශ අතුරින් දෙකක් පමණක් සත්‍ය වී ඉතිරි සියල්ල අසත්‍ය වන අවස්ථා කීයක් තිබේද?

1. 1 2. 2 3. 3 4. 4

28. ඊතලය දෙසින් බැලූ විට කුමන ආකාරයට නිරීක්ෂණය වේද





1 2 3 4

අංක 29 සිට 33 දක්වා වූ එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුර තෝරා ඊට නියමිත අංකය තිත් ඉර මත ලියන්න.

29.. A + B යනු, A,B ගේ සහෝදරයාද A×B යනු A, B මවද A - Bයනු. A,Bගේ සහෝදරිය ද බව දක්වන්-න් නම් C, D ගේ මාමා බව දක්වනුයේ මින් කුමකින්ද?

(1) C×A+D (2) C×D+A (3)C+A×D (4) C - A+D

30. E × F යනු E, F සොහොයුරිය ද E +F යනු E, Fගේ පියාද E - F යනු E, F ගේ සහෝදරයාද බව දක්වන්නේ නම් K, Lගේ නැන්දා බව දක්වනුයේ මින් කුමකින්ද?.

(1) K × G + L (2) K + G - L (3) K+G ×L (4) K-G+L

31. X + Y යනු X, Y සොහොයුරියද X - Y යනු X,Y සහෝදරයාද X×Y යනු X,Y දුවණියද බව දක්වන්නේ නම් A, B ගේ මාමා බව දක්වනුයේ මින් කුමකින්ද?

(1) B + C ×A (2) B-C ×A (3) B ×C + A (4) B×C-A

32. X+Y යනු X, Y ගේ පුතාද, X-Y යනු X, Y ගේ ස්වාමිපුරුෂයාද X×Y යනු X, Y ගේ සහෝදරිය ද බව දක්වන්නේ නම් W, S ගේ මාමා බව දක්වන්නේ මින් කුමකින්ද?.

(1) S+Y-T×W (2) S-Y+T×W (3) S+Y×T-W (4)S×Y-T+W

33. C + D යනු C,D ගේ මවද C*D යනු C,D ගේ සහෝදරයාද C × D යනු C,D ගේ පුතා ද C-D යනු C,D ගේ දුවද බව දක්වන්නේ නම් E, F ගේ ලේලිය බව දක්වන්නේ මින් කුමක්ද?.

(1) F×A-E (2)E-A*F (3) A+F*E (4)F-A* E

34. A+B යනු A,B ගේ භාර්යාවද A-B යනු A,B ගේ පුතාද A×B යනු A,B ගේ සොහොයුරියද බව දක්වන්නේ නම් W, Z ගේ දුව බව දක්වන්නේ මින් කුමක්ද?.

(1)W-X×Y+Z (2)W+X-Y×Z (3)W×X+Y-Z (4)W×X+Z

- අංක 35-39 තෙක් ප්‍රශ්න එක්තරා පන්තියක් පිරිසිදු කිරීම සඳහා පන්තිභාර ගුරුතුමිය විසින් නම් කරන ලද සිසු කණ්ඩායම් පහක් සම්බන්ධයෙන් වන පහත තොරතුරු මත පදනම් වේ.

සඳුදා සිට සිකුරාදා තෙක් පංතිය පිරිසිදු කිරීම සඳහා සිසු සිසුවියන් දෙදෙනා බැගින් වූ මාරු නොවිය හැකි A, B, C, D හා E වශයෙන් වූ කණ්ඩායම් පහක් පහත දැක්වෙන පරිදි පන්තිභාර ගුරුතුමිය විසින් නම් කරන ලදී.

A- සරත් සහ සුනේත්‍රා
B- නිලන්ත සහ නිල්මිණී
C - සුබෝධ සහ සුලෝචනා
D- සාරංග සහ සරසී
E - සිසිර සහ සිසිලියා

මෙම සෑම කණ්ඩායමක් ම පහත සඳහන් පරිදි සඳුදා සිට සිකුරාදා තෙක් වූ සතියේ එක් දිනයකදී පමණක් පිරිසිදු කිරීමේ කටයුතුවල නිරත වෙති.

- සතියේ පළමු දිනය නිමා වන විට පිරිසිදු කිරීමේ උපකරණ ලබාගන්නා නිලන්ත දෙවෙනි දිනයේ පන්තියේ පිරිසිදු කරන කණ්ඩායමේ සාමාජිකයෙකි.

- සුලෝචනා පන්තියේ පිරිසිදු කරන දිනට පෙර දින කණ්ඩායමේ නිල්මිණී සිටින අතර පසු දින කණ්ඩායමේ සාරංග සිටී.

- සතියේ අවසාන දිනයේ පංතිය පිරිසිදු කරන කණ්ඩායමට සිසිලියා ඇතුලත් නොවේ.

තවද සෑම සතියකම අවසාන දිනයේදී පංතියේ පිරිසිදු කරන කණ්ඩායම විසින් පිරිසුදු කිරීමේ උපකරණ කුඩා කාමරයකට දමා එම කාමරයේ යතුර අනිවාර්යෙන්ම පන්ති පාර ගුරුතුමියට භාරදිය යුතුවේ.

මෙම තොරතුරු වලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා,ඊට අදාල වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේදී ඇති තිත් ඉර මත ලියන්න.

35. සතියේ ආරම්භක දිනයේදී පංතිය පිරිසිදු කරන කණ්ඩායමට අයත් සාමාජිකයෙකු වන්නේ මින් කවරෙක්ද?.

(1) සුනේත්‍රා (2) සිසිර (3) සරසි (4) සුබෝධ

36. සතියේ මැද දිනයේදී පංතිය පිරිසිදු කරන්නේ කවර කණ්ඩායමද?

(1) A (2) B (3) C (4) D

37. සිකුරාදා දිනයේ දී පිරිසිදු කිරීමේ උපකරණ සහිත කාමරයේ යතුර පන්තිභාරය ගුරුතුමියට භාරදීමට සිදුවන්නේ මින් කවරෙකුට විය හැකිද?

(1) සිසිලියා (2) සරසි (3) නිල්මිණී (4) සුනේත්‍රා

38. එක්තරා සතියක සිකුරාදා දිනය නිවාඩු දිනයක් වේ නම් එම සතියේදී පිරිසිදු කිරීමේ උපකරණ සහිත කාමරයේ යතුර පන්තිභාර ගුරුතුමියට බාර දෙන ලද්දේ මින් කවරෙකු විසින් විය හැකිද?.

(1) සිසිලියා (2) සරසි (3) සුනේත්‍රා (4) නිල්මිණී

39. සඳුදා සිට සිකුරාදා තෙක් පන්තියේ පිරිසිදු කරන සිසුන් සම්බන්ධයෙන් වන පහත කවර ප්‍රකාශය සත්‍යවේද?

(1) සරසි,සුනේත්‍රාට පෙර දිනයේ දී සුබෝදට පසු දිනයේ ද පංතිය පිරිසිදු කරයි.
(2) නිල්මිණී, සිසිරට පෙර දිනයේද සරසිට පසු දිනයේ ද පංතිය පිරිසිදු කරයි.
(3) සිසිලියා ,සාරංගට පෙර දිනයේ ද සරත්ට පසු දිනයේද පංතිය පිරිසිදු කරයි.
(4) සුලෝචනා, සුනේත්‍රාට පෙර දිනයේ ද නිල්මිණී ද පසු දිනයේද පංතිය පිරිසිදු කරයි.

- අංක 40 සිට 41 දක්වා ප්‍රශන, සංවිධානයක, කාර්යාල ව්‍යුහය පහත සටහනේ දැක්වෙන පරිදි සකසා ඇත.

අධ්‍යක්ෂවරයා ඉහළින්ම සිටී.

අධ්‍යක්ෂවරයා යටතේ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් සිටිති: මූල්‍ය (F) සහ මෙහෙයුම් (O).

සෑම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකුම කළමනාකරුවන් දෙදෙනෙකු කළමනාකරණය කරයි:

මූල්‍ය → කළමනාකරු A සහ කළමනාකරු B

මෙහෙයුම් → කළමනාකරු C සහ කළමනාකරු D

සෑම කළමනාකරුවෙකුම විධායක නිලධාරීන් දෙදෙනෙකු අධීක්ෂණය කරයි (A1, A2, B1, B2,C1,C2, D1, D2 ලෙස ලේබල් කර ඇත).

40. අධ්‍යක්ෂවරයාට අවශ්‍ය වන්නේ විධායක නිලධාරීන්ගෙන් හරියටම අඩකට රහසිගත පණිවිඩයක් යැවීමටයි, නමුත් එකම කළමනාකරුවෙකු යටතේ සිටින විධායක නිලධාරීන් දෙදෙනෙකුට පණිවිඩය ලැබිය නොහැකි බවට රීතියක් ඇත. පණිවිඩය ලැබිය හැකි එකිනෙකට වෙනස් විධායක නිලධාරීන් කණ්ඩායම් ගණන කොපමණද?

(1) 2 (1) 4 (1) 8 (1) 16

41. පණිවිඩය, අධ්‍යක්ෂ → නියෝජ්‍ය → කළමනාකරු → විධායක යන දාමය හරහා යවනු ලැබුවහොත් එක් දාමයක් මඟින් පණිවිඩය යැවිය හැකි උපරිම විධායක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද?

(1) 0 (1) 2 (1) 4 (1) 8



- පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් දක්වනුයේ 2020- 2025 වර්ෂ තුළ රාජ්‍යසේවා තරග විභාග ප්‍රවේශ පරීක්ෂණයන්ට ඉල්ලුම් කළ අයදුම්කරුවන්(පිරිමි සහ ගැහැණු) සංඛ්‍යාවන්ය. ප්‍රස්තාරය අධ්‍යයනය කර අංක 42 සිට 44 දක්වා එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුර තෝරා ඊට නියමිත අංකය තිත් ඉර මත ලියන්න.

42. පිරිමි අයදුම්කරුවන් සංඛ්‍යාවත් ගැහැණු අයදුම්කරුවන් සංඛ්‍යාවත් අතර අඩුම වෙනසක් දක්නට ඇත්තේ කිනම් අවුරුද්දේ ද?.
(1) 2021 (2) 2022 (3) 2023 (4) 2024

43. පිරිමි අයදුම්කරුවන් සංඛ්‍යාව හා ගැහැණු අයදුම්කරුවන් සංඛ්‍යාව සම්බන්ධයෙන් පිළිවලින් 7:6 අනුපාතයක් ඇත්තේ කිනම් අවුරුද්දේද?
(1) 2022 (2) 2023 (3) 2024 (4) 2025

44. 2020- 2025 දක්වා වූ මුලු කාලය තුළම ඉල්ලුම් කළ පිරිමි අයදුම්කරුවන් ප්‍රමාණය හා ගැහැණු අයදුම්කරුවන් ප්‍රමාණය අතර ඇති අනුපාතය කුමක්ද?

(1) 10:9 (2) 14:13 (3) 29:26 (4) 30:29



45. සතුන්ගේ ශාරීරීක වර්ධනය කෙරෙහි දේශගුණයේ බලපෑමක් තිබේදැයි සෙවීමට පර්යේෂණයක් කරන විද්‍යාඥයෙක් එකම බැල්ලියකගේ පැටවුන් දෙදෙනෙකුගෙන් එකකු සීතාධික නුවර එළිය පැස්සේ නිවසකද, අනෙකා උෂ්ණ අධික කොළඹ නගරයේ නිවසක ද ඇති දැඩි කිරීමට සලස්වා ඔවුන්ගේ වර්ධනය කෙරෙහි ඔවුන් ජීවත් වන ප්‍රදේශයේ දේශගුණික තත්ත්වය විශේෂ බලපෑමක් ඇති කරන්නේදැයි පරික්ෂා කර බැලීමට සැලසුම් කළේය. පර්යේෂණ සැලසුම් කරනුයේ උපකල්පක කිහිපයක් මත පිහිටාය. පහල දැක්වෙන ඒවා අතරින් පර්යේෂණයට අදාළ නැති උපකල්පනයක්
වන්නේ කුමක්ද?

(1) නිවාස දෙකේම අයගෙන් එක සමාන ආදරයක් හා සැලකිල්ලත් බලු පැටවුන් දෙදෙනාවම ලැබීය යුතුය
(2) නිවාස දෙකේම තිබෙන කාමර සංඛ්‍යාව හා ඉඩකඩ ප්‍රමාණය සමාන විය යුතුය.
(3) බලු පැටවුන් දෙදෙනා එක සමාන සෞඛ්‍ය සම්පන්න බවකින් යුත්ත විය යුතුය.
(4) බලු පැටවුන් දෙදෙනාට එක වේලකට ලබන කැලරි ප්‍රමාණය සමාන විය යුතුය
(5) බලු පැටවුන් දෙදෙනාට දිනපතා ලැබෙන ව්‍යායාම ප්‍රමාණය සමාන විය යුතුය.

- අංක 45 සිට 50 තෙක් ප්‍රශ්න .ශක්ති. ශාරීරික යෝග්‍යතා සමාජය දෛනික ගාස්තු මත දෙනු ලබන 50% ක ප්‍රසාද වට්ටමට හිමිකම් කීම පිළිබඳ නීති පද්ධතියක් මත පදනම් වේ.

'ශක්ති. ශාරීරික යෝග්‍යතා සමාජයේ සේවය ලබා ගැනීමට පහත සඳහන් පුද්ගලයින්ට සිය දෛනික ගාස්තුවට 50% ක වට්ටමක් හිමි වෙයි.

(i) ආරම්භක සාමාජිකයන්ට ද ඔවුන්ගේ කලත්‍රයන්ට ද ඔවුන්ගේ වයස අවුරුදු 25 ට අඩු දරුවන්ට
(ii) ආබාධිත සාමාජිකයන්ට
(iii) වයස අවුරුදු 60 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට
(iv) ආරක්ෂක අංශවල නියුතු හා ඉන් විශ්‍රාම ලත් අයට, ඔවුන්ගේ කලත්‍රයන්ට හා ඔවුන්ගේ වයස අවුරුදු 18 ට අඩු දරුවන්ට
(v) රැකියාවක් නොකරන වයස අවුරුදු 35 ට අඩු කාන්තාවන්ට
(vi) ලියාපදිංචි සමාජ සේවා ආයතනවල සමාජ සේවකයන්ට
(vii) අවුරුදු 10 ක සාමාජික මුදල් එකවර ගෙවා බැඳුණු සාමාජිකයන්ට

මෙම තොරතුරු වලට අනුව පහත එක් එක් ප්‍රශ්නයේ සඳහන් පුද්ගලයා වට්ටම ලැබීමට සුදුසුකම් ලබා ඇත් ද එසේ නැති නම් සුදුසු නොවන්නේ ද යන බව තීරණය කර, පිළිතුරට අදාළ වරණය තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

46. • තිස් පස් වියැති ශ්‍රීමතී බාලපටබැඳි ආබාධිත සෙබළියකි.
• ඇගේ සැමියා .ශක්ති. ශාරීරික යෝග්‍යතා සමාජයේ ආරම්භක සාමාජිකයෙකි.
• ඒ අනුව ශ්‍රීමතී බාලපටබැඳි

(1) (i) හා (iv) යටතේ සුදුසුකම් ලබයි.
(2) (i) හා (ii) යටතේ සුදුසුකම් ලබයි.
(3) (i), (ii) හා (iv) යටතේ සුදුසුකම් ලබයි.
(4) සුදුසුකම නොලබයි.

47. • දේවක රාමනායකගේ වයස අවුරුදු 14 කි.
• ඔහු විශ්‍රාමික සොල්දාදුවකු වන කෝප්‍රල් රාමනායකගේ පුත්‍රයායි.
• කෝප්‍රල් රාමනායක ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමයේ සභාපති ය.
• කෝප්‍රල් රාමනායක ශක්ති ශාරීරික යෝග්‍යතා සමාජයේ දස වසරක සාමාජික මුදල් තෙවසරකින් ගෙවී යන පරිදි වාරික තුනකින් ගෙවීමට කටයුතු කර ඇත.
ඒ අනුව දේවක රාමනායක,

(1) (iv) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(2) (vi) හා (vii) යටතේ සුදුසුකම් ලබයි.
(3) (iv) හා (vii) යටතේ සුදුසුකම් ලබයි.
(4) සුදුසුකම් නොලබයි.

48. • කාදර් බුහාරි 28 වියැති ය.
• ඔහු ශක්ති ශාරීරික යෝග්‍යතා සමාජයේ ආරම්භක සාමාජික මොහමඩ් කාදර්ගේ පුත්‍රයෙකි.
ප්‍රකට සමාජ සේවකයකු වන මොහමඩ් කාදර් ලියාපදිංචි ලේ බැංකුවක නිර්මාතෘ වෙයි.
මේ අනුව කාදර් බුහාරි,
(1) (i) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(2) (vi) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(3) (i) හා (vi) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(4) සුදුසුකම් නොලබයි.

49. • අනුජා ගමගේ, ශක්ති ශාරීරික යෝග්‍යතා සමාජයේ ආරම්භක සාමාජිකයකුගේ 18 වියැති දියණියකි.
• දක්ෂ පිහිනුම්කාරියක් හා ප්‍රවීණ චෙස් ක්‍රීඩිකාවක් ද වන ඇය පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාව ද වෙයි.
• ඇගේ පියා විශ්‍රාමික රජයේ සේවකයෙකි.
මේ අනුව අනුජා ගමගේ,
(1) (i) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(2) (iv) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(3) (i) හා (v) යටතේ සුදුසුකම ලබයි
(4) සුදුසුකම් නොලබයි..

50. • 24 වියැති සුමනා ආරිය සිරි ප්‍රකට සමාජ සේවකයකුගේ ලේලිය වෙයි.
• බැංකු නිලධාරිනියක වන ඇය ශක්ති ශාරීරික යෝග්‍යතා සමාජයේ වර්ෂ 7 ක සාමාජික මුදල් එකවර ගෙවා ඇත.
• ඇගේ ස්වාමිපුරුෂයා ශ්‍රී ලංකා යුධ හමුදාවේ බ්‍රිගේඩියර්වරයෙකි.
මේ අනුව සුමනා ආරිය සිරි.
(1) (i) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(2) (iv) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(3) (vi) හා (vii) යටතේ සුදුසුකම් ලබයි.
(4) සුදුසුකම් නොලබයි.

සියලුම හිමිකම් ඇවිරිණි

All Rights Reserved

පිටුව	ප්‍රශ්න අංකය	ලකුණු
1	1 - 10	
2	11 - 21	
3	22 - 30	
4	31 - 40	
5	41 - 45	
6	46	
7	47	
8	48	
එකතුව		
උත්තර පත්‍ර පරීක්ෂක		
ලකුණු පරීක්ෂා කළේ		

විවෘත තරඟ විභාගය - 2025

(01) භාෂා හැකියාව (සිංහල)

පැ දෙකයි මිනිත්තු තිහයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු සැපයීම සඳහා සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, අමතර කඩදාසි ලබාගන්න.

විභාග අංකය : ....

- **අංක 01 සිට 5 තෙක් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත යෙදුම තෝරා එයට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

1. (1) අධීක්ෂනය (2) පරිණාමය (3) සාමාර්ත්‍ය (4) මොණරා (-----)
2. (1) කළමනාකරණ (2) උල්ලංඝනය (3) ජනශෘතිය (4) එළවලු (-----)
3. (1) දෘෂ්‍යමාන (2) උච්ඡාරණ (3) ආහාසය (4) දෘෂ්ටි (-----)
4. (1) දිළිඳු (2) දැලි රැවුල (3) මැරුනු (4) සඳකඩපහණ (-----)
5. (1) ප්‍රේෂණ (2) බටනලාව (3) වෙරලු (5) යුගළ (-----)

(ලකුණු 1×5 - 5)

- **අංක 6 සිට 8 තෙක් ප්‍රශ්නය යටතේ දී ඇති පද හතර අකාරාදී පිළිවෙළට සකස් කළ විට පිහිටන නිවැරදි අනුපිළිවෙළ තෝරා ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති තිත් ඉර මත ලියන්න.**

06. (අ) ක්ෂීරපායී (ආ) ක්ලාක් (ඉ) තරුව (ඊ) ත්‍යාගය
    (1) අ ඊ ආ ඉ (2) අ ආ ඊ ඉ (3) ආ අ ඊ ඉ (4) අ ආ ඉ ඊ (-----)
07. (අ) චිත්‍රය (ආ) චිත්‍රණය (ඉ) චිත්‍රාගාරය (ඊ) සෘණ
    (1) අ ඉ ඊ ආ (2) ඊ අ ආ ඉ (3) ඊ ආ අ ඉ (4) අ ඊ ඉ ආ (-----)
08. (අ) තිව්‍ර (ආ) ක්‍රෑර (ඉ) චෞර (ඊ) ගෞරව
    (1) අ ඊ ඉ අ (2) ආ ඊ ඉ අ (3) ඊ අ ඉ ආ (4) ඊ ආ ඉ අ (-----)

(ලකුණු 1×3 - 3)

- **අංක 9 සහ 10 යන එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද හතර අතුරින් නිවැරදිව විසන්ධිකර දක්වා නොමැති පදය තෝරා ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියෙහි දී ඇති තිත් ඉර මත ලියන්න.**

09. (1) ගිනියම් - ගිනි + යම් (2) තද්භව - තත් + භව
    (3) කුමාරෝත්පත්තිය - කුමාර + උත්පත්තිය (4) පන්සිල් - පස් + සිල් (-----)

10. (1) වාග්ධාරා - වාක් + ධාරා (2) වියවුල් - විය + අවුල්
    (3) ගුරූපදේශ - ගුරු + උපදේශ (4) තම්පලා - තඹ + පලා (-----)

(ලකුණු 1×2 - 2)

- **අංක 11 සහ 12 යන එක් එක් ප්‍රශ්නයේ මුලින් දැක්වෙන පදයට සමානාර්ථවත් නොවන පදයක් ඇතුලත් පිළිතුර තෝරා ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියෙහි දී ඇති තිත්තිර මත ලියන්න.**

11. (1) අනුරාගය - ආලය, අනුරතිය, ස්නේහය, ආදරය
(2) ගස - තුරු, රුක, පාදප, වෘක්ෂය
(3) අලියා - මතඟ, පිනිපා, වරුණ, ගජ
(4) මුහුණ - මුව, වත, වක්ත්‍රය, නළලත (-----)

12. (1) ප්‍රසිද්ධ - පවර, පසිඳු, ප්‍රකට, පතළ
(2) කැලෑව - වල, වනය, වණය, බැද්ද
(3) රත්තරන් - කසුන්, කනක, කාන්චන, ස්වර්ණ
(4) ප්‍රශංසාව - ස්තුතිය, තුතිය, පැසසුම, ගෞරවය (-----)

(ලකුණු 1×2 - 2)

- **අංක 13 සිට 22 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ වර්ණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිර මත ලියන්න.**

13. අකුරු ගැළපෙන ලද කල්හි අර්ථවත් වචනයක් සාදාගත හැක්කේ මින් කවරකින් ද?.

(1) වි ණා ශ් ලේ ම ක ය (2) ං වි ෂේ ශ ම ය (3) ධි ර ය පා නා ම කා (4) ය ග ද් ක ර පෞ ලී ණ (-----)

14. සමාසයක් නො වන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) දිවිසයුර, සසරකතර, හදවිල, ජීවනකුසුම
(2) නිහඬ, නිමල, නිපුණ, නිවරද
(3) නිල්දිය, සුදුහුණු, රතුපලස, කළුපැල්ලම
(4) රජගෙදර, තාපසාරාමය, බලුකුඩුව, ළමාසමිතිය (-----)

15. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) කඩුවෙල, කොට්ටාව, කෝට්ටේ, කොටුව
(2) ආටිගල, ඇඹුල්ගම, ඉංගිරිය, කොළොන්නාව
(3) කැළණිය, ගම්පහ, ජාඇල, කඳාන
(4) මාතර, හම්බන්තොට, පුත්තලම, මීගමුව (-----)

16. තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) බලවත්, කුලවත්, පුවත්, තෙදවත්
(2) සාකල්‍ය, ප්‍රාබල්‍ය, සාඵල්‍ය, කෞශල්‍ය
(3) ඉහටි, පහටි, ඉගටි, කරටි
(4) මුධරතර, සුන්දරතර, ශ්‍රේෂ්ඨතර, වෘද්ධතර (-----)

17. කෘදන්ත පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.

(1) විසිරුම්, ඇසිරුම්, ඉසිරුම්, හැසිරුම් (2) උතුළ, වපුළ, අතුළ, හළ
(3) වැසිලි, බැසිලි, කිසිලි, නැසිලි (4) ලිඛිත, සංහෝධිත, රචිත, දේශිත (-----)

18. උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.

(1) ප්‍රබල, නිකෙලෙස්, වියෝග, අබිමන් (2) පිරිසුදු, උපහාර, අනුරූප, අවමන්
(3) ප්‍රතිඵල, අවගුණ, ප්‍රත්‍යක්ෂ, අභිධර්ම (4) සුගන්ධ, සුමති, සුවිසි, සම්මුති (-----)

19. පහත දී ඇති වචනයන්හි තේරුම නිවැරදිව අනුපිළිවෙළින් දක්වා ඇති පද ප්ළිය තෝරන්න

ලකුණ්ය වූ / සමයාන්තර / පදාසයක් / භාෂාන්තර / විස්මයාවහ

(1) දීර්ඝ වූ, ප්‍රදේශයක්, භාෂා පිළිබඳ, අරුම පුදුම, ආගමට සම්බන්ධ

(2) මිටි වූ, ආගම් පිළිබඳ වූ විශාල ප්‍රදේශයක්, භාෂාවන් පිළිබඳ, පුදුමය ඇති කරවන

(3) ආගම් පිළිබඳ වූ, විශාල ප්‍රදේශයක්, භාෂාවන් පිළිබඳ, පුදුම සහගත

(4) දික් වූ, සංස්කෘතිය හා බැඳුණු, විශාල ප්‍රදේශය, භාෂා පිළිබඳ, පුදුමයට පත් වූ (-----)

20. ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය තුමක් ද?

(1) වදාළ, වගුළ, මතුළ, හදාළ

(2) ගයමින්, නටමින්, දුවමින්, හඬමින්

(3) කඩිති, දියති, පැනිති, කැඳිති

(4) පෞරුෂ, යෞවන, උරුමය, අයෝමය (-----)

21. ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය කුමක් ද?

(1) දෙව්ලොව, අසුර, රතුපුල්, දසබල

(2) භෞතික, නෛතික, ඖදාර්ය, සාම්‍ය

(3) දේවෝත්තම, මනුෂ්‍යාත්මය, මහෞෂධ, ප්‍රත්‍යුපකාර

(4) මෙන්, සේ, එව්, අව (-----)

22. පහත සඳහන් වරණ අතරින් නිවැරදි වරණය තොරන්න.

(1) 'ෙ' යනු 'එ' යන්න නියෝජනය කරන පිල්ලමයි.

(2) 'ඓතිහාසික' යනුවෙන් කොම්බු දෙක සහිත ව ලිවීම නිරවද්‍ය ය.

(3) ව්‍යඤ්ජනයක් සමඟ මෙන් ම ස්වරයක් සමඟ ද කොම්බු දෙක යෙදේ.

(4) 'ඓ' යනු 'අ + එ' යන අක්ෂර සන්ධි වීමෙන් සෑදුණු අකුරකි. (-----)

(ලකුණු 1×10 - 10)

- **අංක 23 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වාක්‍යාංශයේ නිවැරදි අරුත දෙන තනි යෙදුමට අදාළ අනු අංකය තිත් ඉර මත ලියන්න.**

23. යම්කිසි නිර්මාණයක මතුපිටින් හඳුනාගත හැකි අර්ථය

(1) ව්‍යංගාර්ථය (2) වාච්‍යාර්ථය (3) අර්ථාන්විත (4) ස්වභාවෝක්තිය (-----)

24. අනුමානය වශයෙන් සිතාගත් දෙය

(1) උපකල්පනය (2) කාලවරෝධය (3) මනෝමය (4) කල්පිතය (-----)

25. යම් කටයුක්තකින් අපේක්ෂිත ප්‍රතිඵලය ලැබීම

(1) කාර්ය සාපල්‍යතාව (2) කාර්ය සාධනය (3) කාර්ය ප්‍රතිඵලය (4) කාර්යාකාරඥානය (-----)

(ලකුණු 1×3 - 3)

- **අංක 26යේ සිට 28 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති ප්‍රකාශයට වඩාත් හොඳින් ගැලපෙන ප්‍රස්ථාව පිරුළ තෝරා ඊට අදාළ වර්ණයෙහි අංකය තිත් ඉරමත ලියන්න.**

26. අවබෝධයකින් තොරව වැඩ කිරීම

(1) කලුවා මාරපන් ගියා වගේ

(2) අටුව කඩා පුටුව හැදුවා වගේ

(3) බල්ලන්ට ලෙලි පොල් දුන්නා වගේ

(4) අතු කඩා මොර කන්නා වගේ (-----)

27. නිශ්චිතතීරණයක් නොගෙන සිටීම

(1) ඉබ්බා දියට දැම්මා වගේ

(2) හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ

(3) මඩේ හිටවපු ඉන්න වගේ

(4) එළිපත්ත උඩ ඉන්න බල්ලා වගේ (-----)

28. දුෂ්කර කාර්යයක නියැලීම

(1) කුරුල්ලන්ට වැට බැඳීම

(2) කණා පල්ලම් බැසීම

(3) පරංගියා කෝට්ටේ ගියා වගේ

(4) කණාමැදිරි එළියෙන් නිදන් සෙවීම (-----)

(ලකුණු 1×3 - 3)

- අංක 29 සහ 30 යන එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද පේළි අතුරින් යුගල පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති සිත් තුර මත ලියන්න.

29. (1) අඩ දබර, උකුළු මුකුළු, ඉවක් බවක්, උදව් පදව්

(2) යටි මඩි, ගුණ දොස්, ගුටි බැට, ගසා බසා

(3) නහින දෙහින, උදවු පදවු, කුල මල, කල් යල්

(4) කළු සුදු, අනං මනං, ආත බූත, කෝලාහල (-----)

30. (1) වෙද හෙදකම්, සිරිත් විරිත්, සුන් බුන්, හොර බොරු

(2) හිතා මතා, රොස් පරොස්, හර බර, විදෙන ලෙලෙන

(3) මැහුම් ගෙතුම්, ගල් මුල්, ගොඩ මඩ, කැලේ කොලේ

(4) කපා කොටා, ලියා කියා, අඩා දොඩා, නටා ගයාා (-----)

(ලකුණු 1×2 - 2)

- **අංක 31 සිට 34 තෙක් එක් එක් ප්‍රශ්නයේ නිවැරදි වාක්‍ය තෝරා ඊට අදාළ අනු අංකය තිත් ඉර මත ලියන්න.**

31. ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

(1) දරුවෝ නොමග ගොස් ඇත.

(2) සත්තු සඳහා වෙන් වූ උද්‍යානයක් දෙහිවල තිබේ.

(3) අපි දෙවියන් පුදනු ලබමු.

(4) තරු පෙළ සැඳෑ අහසේ බැබළුණේ ය. (------)

32. ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තොරන්න.

(1) ඔවුහු කන්ද බසිද්දී ඇතෙක් ඉදිරියට ආවේ ය. (2) ඇතැම් සම්ප්‍රදායන් වෙනස් වී ඇත.

(3) වීදාගම හිමියන් ලෝවැඩ සඟරාව රචනා කළහ. (4) ගංගාවන් මුහුදට ගලති. ය (------)

33. ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

(1) සමහරු විනෝදයට නොයෙක් නැටුම් නටති.

(2) සිරිසඟබෝ රජතුමා දැහැමි පාලකයෙකු විය.

(3) අපි මෙසේ කියතියි කවුරු විශ්වාස කරත් ද?

(4) අප විසින් සමගිදම් රැකිය යුත්තෙමු. (------)

සිංහල නම්... ආර්. නානායක්කාර

34. ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

(1) අවුරුදු කාලයෙහිම මඟ දෙපස සල්පිල් ඇත්තාහ.

(2) ජපන්නු හපන්නු වූ.

(3) අමාත්‍යතුමා ජනතාව අමතනු ලබයි.

(4) සියලු ඥාතිමිත්‍රාදීන් මේ කණගාටුදායක නිවේදනය පිළිගනිත්වා !

(5) එක් කෙනෙක් තරගය ජයග්‍රහණය කළහ. (------)

35. ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

(1) එක් කෙනෙක් තරගය ජයග්‍රහණය කළහ.

(2) හෙතෙම කවියෙක් සේම ගොවියෙක් ද වේ

(3) මා නොගියේ මාගේ මිතුරන් බව ඔවුහු කීහ

(4) බොහෝ යාචකයන් මිනිස්සු මුලාකරති (------)

(ලකුණ 1×2 - 4)

- **ප්‍රශ්න 35 සිට 40 දක්වා පහත ඡේදය කියවා ඊට යටින් දී ඇති එක් එක් ප්‍රකාශය හරිනම් හරි ලකුණ ද වැරදි නම් වැරදි ලකුණ ද යොදන්න.**

ගෝලීය සරණාගත අර්බුදයේ සංකීර්ණත්වය ගැන සැලකිලිමත්ව සහ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අදාළව, ජාත්‍යන්තර ගිවිසුම් වලට සහ ජාත්‍යන්තර එකමුතු භාවයට අනුකූලව. සහ වගකීම් දැරීමට හවුල්වීමේ අධිෂ්ඨානයෙන් යුතු වූ ජාත්‍යන්තර ප්‍රජාව විසින් පුළුල් ක්‍රියාමාර්ගයක් ගැනීමේ අවශ්‍යතාව මානව අයිතිවාසිකම් පිළිබඳ ලෝක සම්මේලනය පිළිගනී. එබඳු ක්‍රියාමාර්ගයක් ගැනීම, ප්‍රශ්නයට මුහුණපා ඇති රටවල් සහ අදාළ සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් සහ සහයෝගිතාවෙන්ද එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස්ගේ වරම සිත්හි තබා ගනිමින්ද සිදු කළ යුත්තකි. සරණාගතයන්ගේ සහ වෙනත් අස්ථාන ගත වූ තැනැත්තන්ගේ සංක්‍රමණයන්ට මුල්වන අහේතු සාධක සහ ආනුභාග පිළිබඳව ක්‍රියාකාරී වන ක්‍රමෝපාය සංවර්ධනය කළ යුතුය. හදිසි අවස්ථාවන්ට මුහුණ දීමට ලක ලැහැස්තිව සිටීම සහ ප්‍රතිචාර යන්ත්‍රණය ශක්තිමත් කිරීම, සඵල ආරක්ෂාව සහ ආධාර සැපයීම, කාන්තාවන්ගේ හා ළමුන්ගේ විශේෂ අවශ්‍යතා මෙන්ම, කල් සවත්නා විසඳුම් ගැන ද සිත්හි තමා ගනිමින් ජාත්‍යන්තර සරණාගත සම්මේලනය මගින් සම්මත කරගන්නා ලද ආකාරයේ විසඳුම් ද ඇතුළත්ව මූලික වශයෙන් වඩාත් උචිත විසඳුම් වූ අභිමානයෙන් යුතුව සහ සුරක්ෂිත ලෙස ස්වේච්ඡාවෙන් සිය රටට ආපසු පැමිණීම සඳහා ක්‍රමෝපායයන් වර්ධනය කර ගැනීම මේ ක්‍රියාමාර්ගයට ඇතුළත් විය යුතු ය.

(36) සරණාභකයන් පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීමේදී සම්බන්ධ විය යුතු කණ්ඩායම් දෙක වන්නේ කාන්තාවන් හා ළමුන් ය. (……)

(37) සරණාභකයන් පිළිබඳ සොයා බලන්නේ මහකොමසාරිස් ය. (……)

(38) පිහිටවිය යුතු පිරිස් කණ්ඩායම් දෙකක් ගැන මෙහි දැක්වේ. (……)

(39) ක්‍රමෝපාය සකස් කිරීමේදී විශේෂයෙන් සැලකිය යුතු කරුණ වන්නේ සඵල ආරක්සාව හා ආධාර සැපයීම පමණි. (……)

(40) සරණාගතයින්ට අභිමානයෙන් යළි තම රටට ඒමට හැකිවිය යුතු යි. (……)

(ලකුණු 12)

- **අංක 41 සිට 45 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති කෙටි වාක්‍ය තුන අර්ථවත් අදහසක් ප්‍රකාශ වන සේ තනි වාක්‍යයක් සේ ගලපා දෙන ලද ඉරි මත ලියන්න.**

41. ළමුන්ට තරඟකාරී අධ්‍යාපනයක් උරුම වී ඇත. ඔවුහු තරගයට අවතීර්ණ වෙයි. ඒ නිසා ම ඔවුන් තුළින් රසවින්දනය ගිලිහී ඇත.

....

....

....

42. නීතී විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ ගොස් ඇත. නීතී විරෝධී නොවන මත්ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාමත් මීට එක් හේතුවකි. තවත් හේතුවක් වන්නේ නීතී නිසි පරිදි ක්‍රියාත්මක නොවීමයි.

....

....

....

43. සූර්ය ශක්තියෙන් විදුලිය නිපදවීම ඉහළ නැංවිය යුතු ය. එවිට බොරතෙල් ආනයනය සීමා කළ හැක. එය දිගුකාලීනව රටට වාසියකි.

....

....

....

44. රිය අනතුරුවලට එකම හේතුව රියදුරන් ම නොවේ. මහාමාර්ග පද්ධතියේ ගැටලු එක් හේතුවකි. මගීන්ගේ නොසැලකිල්ල තවත් හේතුවකි.

....

....

....

45. උපද්‍රව ඇතිවීම වැළැක්වීම අසීරු ය. උපද්‍රවයකින් වන හානිය අවම කළ හැකි ය. ආපදා කළමනාකරණයේ දී සිදුවන්නේ එයයි.

....

....

....

(ලකුණු 2×5 - 10)

46. පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව 3 න් එකක් පමණක් වන සේ සාරාංශකොට ලියා සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ලෝකයේ බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද වැඩිහිටි ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ සමාජ අර්බුදයට මුහුණ දෙමින් සිටී. මෙම වැඩිහිටියන්ට රැකවරණය සැලසීම සම්බන්ධයෙන් වර්තමානයේ ප්‍රබල සමාජ මතයක් ගොඩනැගෙමින් පවතී. බටහිර රටවලටත් ඇතැම් පෙරදිග රටවලටත් වඩා ශ්‍රී ලාංකේය පවුල හා ප්‍රජාව තුළ වැඩිහිටියන් රැකබලා ගැනීමට අදාළ ව ක්‍රියාත්මක වූ ප්‍රජාපාදක ආරක්ෂිත ජාලයක් පැවති බව සාම්ප්‍රදායික සමාජ රටාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. වර්තමානයේ පවා බොහෝ වැඩිහිටියන් තම දරුමුණුබුරන් හෝ ඥාතීන් සමග ජීවත් වීමට වැඩි කැමැත්තක් දක්වන බව සමාජ පර්යේෂකයෝ පවසති. සාඵල්‍යතාව අඩුවීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම, දේශීය හා විදේශීය සංක්‍රමණ, නාගරීකරණය හා කාන්තාවන් රැකියාවල නිරත වීම ආදී සාධකවල ඍජු බලපෑම නිසා පවුල කේන්ද්‍රීය ව ක්‍රියාත්මක වූ වැඩිහිටියන් රැකබලා ගැනීමේ ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් වෙමින් පවතී. බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන පරිදි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදුවන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් හට ගැනෙන පවුල් විසංවිධානය නිසා වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධා මතු වේ. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා තදනුබද්ධ ධනාත්මක ලක්ෂණ, යටිතල පහසුකම් හා අවශේෂ සේවාවන් ප්‍රවර්ධනය කිරීමටත් කළමණාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීමටත් කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වුවහොත් මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යුහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. වියපත් වූවන් හැකිතාක් දුරට රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කර ගැනීමට ප්‍රතිපත්ති සැකසීම ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් වීමටත් රටේ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් වීමටත් බලපානු ඇත.

සිංහල නම්... ආර්. නානායක්කාර

(ලකුණු 15)

සිංහල නම්... ආර්. නානායක්කාර

47. ඔබ ප්‍රදේශයේ ජනතාව මුහුණදෙන ගැටලුවක් විසඳන ලෙස ඉල්ලා අදාළ රාජ්‍ය ආයතනය වෙත යැවෙන ලිපියක් සකස් කරන්න.

සිංහල නම්... ආර්. නානායක්කාර

48. පහත මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 250කට නොවැඩි විශ්ලේෂණාත්මක රචනයක් ලියන්න.

1. රාජ්‍ය සේවය තව තවත් කාර්යක්ෂම කිරීම යුගයේ අවශ්‍යතාවයකි
2. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මහජනයාට අදහස් පළකිරීමේ ඇති අයිතිය
3. මහාමාර්ග අනතුරු වළකාලීමට රජයෙන් ගතයුතු ක්‍රියාමාර්ග
4. බෝ නොවන රෝග වලක්වා ගැනීම උදෙසා
5. ළමා පරපුර හා රටේ හෙට දවස

UNLOCK AFTER PAYMENT

සිංහල නම්... ආර්. නානායක්කාර

සිංහල නම්... ආර්. නානායක්කාර

අභිමානවත් රාජ්‍ය සේවයට පිය නගන්නට,
අපගේ සම්මන්ත්‍රණයට සම්බන්ධ වෙන්න..

සම්මන්ත්‍රණයට සහභාගී වීමට රු 1000/= ක සම්මන්ත්‍රණ ගාස්තුව ගෙවා Receipt එක 070 550 53 87 ට ඔබගේ නම, දුරකථන අංකය සටහන් කර whatsapp කරන්න. (Online payment කිරීමේ හැකියාව ද පවතී.)

Bank : Commercial Bank
Account No : 8020543583
Branch : Middeniya
Name : GT Madushanka

Bank : NSB
Account No :100 900 220 299
Branch : Morawaka
Name : G .T . Madushanka

Bank : People's Bank
Account No : 265 2002 4001 65 29
Branch : Middeniya
Name : G.T.Madushanka.

Bank : BOC
Account No : 72733537
Branch : Middeniya
Name : G.G.T.Madushanka

Contact : 070 550 53 87